රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சு
**Ministry of Public Administration, Home Affairs, Provincial Councils and Local Government**

නිදහස් චතුරශ්‍රය, කොළඹ 07, ශ්‍රී ලංකාව. சுதந்திரச் சதுக்கம், கொழும்பு 07, இலங்கை. Independence Square, Colombo 07, Sri Lanka

දුරකතන தொலைபேசி: **(94) 011- 2696211-13** Telephone **(94) 011- 2166000**
ෆැක්ස් தொலைநகல்: **(94) 011- 2695279** Fax
ඊ-මේල් மின்னஞ்சல்: **information@pubad.gov.lk** E-mail
වෙබ් අඩවිය இணையத்தளம்: **www.pubad.gov.lk** Web Site

මගේ අංකය / எனது இல / My No: DG/Com/බහුකාර්ය සංවර්ධන
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2020.07.02

සියළුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්

**<u>අඩු ආදායම්ලාභී පවුල් වල සාමාජික සාමාජිකාවන් 100,000 ක් සඳහා වෘත්තීය පුහුණුව ලබා දීමේ ජාතික වැඩසටහන</u>**

රජයේ **"සෞභාග්‍ය දැක්ම"** රාජ්‍ය ප්‍රතිපත්තියට අනුව දිළිඳු පවුල් නගා සිටුවා ආර්ථික සංවර්ධනයට ඔවුන් දායක කර ගැනිමේ වැඩපිළිවෙල යටතේ, නිපුණ ශිල්පින් 100,000 ක ගෙන් යුත් බහුකාර්ය කාර්ය සාධක බලකායක් පිහිටුවීමට යෝජිතය. මේ යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරාගත් අයදුම්කරුවන් රැකියාවට අනුයුක්ත කිරිමට ප්‍රථම මාස 06 ක කාලයක් තෝරාගත් වෘත්තියක පුහුණු පාඨමාලාවක් සඳහා යොමුකර අවසානයේදී ජාතික වෘත්තිය සුදුසුකම් සහතිකය (NVQ -3 මට්ටම) ලබාදීමට තීරණය කර ඇත. මෙම ජාතික වැඩසටහනේ වෘත්තීය පුහුණු කිරිමේ කටයුත්ත ඉටු කිරිම බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුවේ ඉල්ලීම මත ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරිම් අධිකාරිය (NAITA) විසින් සිදුකරනු ඇත.

## 2. පළාත් කමිටු

මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරිමට අදාලව පළාත් ප්‍රධාන ලේකම්වරුන් යටතේ පවතින ආයතන වල සෘජු සහයෝගයද ලබා දිය යුතුවේ. එබැවින් සියළුම පළාත් සභා යටතේ පවතින ආයතන වල සහයෝගය ලබා ගත හැකි වන පරිදි පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පළාත් කමිටුව පත්කළ යුතුවේ.

### 2.1 පළාත් කමිටු සංයුතිය

- පළාත් ප්‍රධාන ලේකම් (සභාපති )
- පළාත තුළ පිහිටි දිස්ත්‍රික්ක නියෝජනය වන පරිදි දිස්ත්‍රික් ලේකම්වරුන්ගේ නියෝජිතයෙක්
- බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තු පළාත් නියෝජිත
- NAITA ආයතනයේ අදාල පළාත භාර අධ්‍යක්ෂක
- මෙම පුහුණු කටයුතු සඳහා සෘජු ලෙස සම්බන්ධිත අදාල අමාත්‍යාංශ නියෝජිතයන්ද අවස්ථානුකූලව කමිටු සාමාජිකයින් ලෙස සම්බන්ධවනු ඇත.

..2.

**2.2 කාර්ය භාරය**

2.2.1 පළාත් බලප්‍රදේශයෙහි සිටින පුහුණු සම්පත්දායකයින් හදුනා ගැනිම.

2.2.2 මෙම පුහුණු වැඩසටහන සාර්ථක කර ගැනිමට සහ පුහුණු අධික්ෂණ කටයුතු සඳහා ප්‍රයෝජනවත්වේ යැයි දිස්ත්‍රික් මෙහෙයුම් කමිටු විසින් හදුනා ගන්නා ගනු ලබන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නිරත පළාත් සභා වලට අයත් ක්ෂේත්‍ර නිළධාරී හෝ තාක්ෂණික නිළධාරින් අවස්ථානුකූලව මුදාහැරිමට කටයුතු කිරිම.

2.2.3 පුහුණු කටයුතු සඳහා දේශනශාලා සහ යටිතල පහසුකම් හදුන්වාදීම සහ සපයාදීමට කටයුතු කිරිම.

2.2.4 න්‍යායික දැනුමින් පසු මෙම පුහුණු වන්නන් කර්මාන්ත/ ආයතනයන් හි කාර්යස්ථ පුහුණුව (OJT) සඳහා යොමු කිරිමේදී ඒ සඳහා අවශ්‍ය පහසුකම් ලබා දීම.

## 3. දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව

මෙම පුහුණු කටයුතු ඒ ඒ දිස්ත්‍රික්ක තුල ප්‍රාදේශීය ලේකම් කාර්යල මට්ටමින් සිදුකිරිමට නියමිතය. එය සාර්ථක කර ගැනිම සඳහා දිස්ත්‍රික් ලේකම්වරු ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් මෙහෙයුම් කමිටු ස්ථාපනය කිරිමට යොජිත අතර එම කමිටු ජුලි මස 10 දිනට පෙර පිහිටුවිම සිදුකල යුතුය.

**3.1 දිස්ත්‍රික් මෙහෙයුම් කමිටු සංයුතිය**

- දිස්ත්‍රික් ලේකම් / අතිරේක දිස්ත්‍රික් ලේකම් (සභාපති )
- බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තු දිස්ත්‍රික් නියෝජිත
- පළාත් ප්‍රධාන ලේකම්ගේ නියෝජිතයෙකු
- NAITA ආයතනයේ දිස්ත්‍රික් කළමණාකරු
- මෙම පුහුණු කටයුතු සඳහා සෘජු ලෙස සම්බන්ධිත අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සංස්ථා හා මණ්ඩල නියෝජිතයන්ද අවස්ථානුකූලව කමිටු සාමාජිකයින් ලෙස සම්බන්ධවනු ඇත.

මෙම ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරිමේදී දිස්ත්‍රික් ලේකම් කාර්යල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යල ප්‍රමුඛ ආදාල නිළධාරින්ගේ පූර්ණ සහයෝගය ඉහත කමිටු හරහා නයිටා (NAITA) ආයතනයට ලබාදිම කල යුතුය.

..3.

**3.2 කාර්ය භාරය**

3.2.1 දිස්ත්‍රික්කය තුල සිටින පුහුණු සම්පත්දායකයින් හදුනා ගැනිම.

3.2.2 මෙම පුහුණු වැඩසටහන සාර්ථක කර ගැනිමට සහ පුහුණු අධික්ෂණ කටයුතු සඳහා ප්‍රයෝජනවත්වේ යැයි දිස්ත්‍රික් මෙහෙයුම් කමිටුව විසින් හදුනා ගන්නා ගනු ලබන, කේෂ්ත්‍ර නිළධාරී හෝ තාක්ෂණික නිළධාරින් අවස්ථානුකූලව මුදාහැරිමට කටයුතු කිරිම.

3.2.3 පුහුණු කටයුතු සදහා දේශනශාලා සහ යටිතල පහසුකම් හදුන්වාදීම සහ සපයාදීමට කටයුතු කිරිම.

3.2.4 න්‍යායික දැනුමින් පසු මෙම පුහුණු වන්නන් කර්මාන්ත/ ආයතනයන් හි කාර්යස්ථ පුහුණුව(OJT) සදහා යොමු කිරිමේදී ඒ සදහා අවශ්‍ය පහසුකම් ලබා දීම.

3.2.5 ප්‍රාදේශීය ක්‍රියාකාරී කමිටුවෙන් මතු වන ගැටලු නිරාකරණය සදහා පහසුකම් සැළසීම

## 4. ප්‍රාදේශීය ක්‍රියාකාරී කමිටුව

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් තෝරාගත් අයදුම්කරුවන්ගෙන් සමන්විත මෙම කණ්ඩායම පුහුණු කිරිම, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින්ම සිදු කල යුතු වන බැවින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය ප්‍රමුඛ ආදාල නිළධාරින්ගේ පූර්ණ සහයෝගය ඉහත කමිටු හරහා නයිටා (NAITA) ආයතනයට ලබාදිම කල යුතුය.

### 4.1 ප්‍රාදේශීය ක්‍රියාකාරී කමිටු සංයුතිය

- ප්‍රාදේශීය ලේකම් / සහකාර ප්‍රාදේශීය ලේකම් (සභාපති )
- බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තු ප්‍රාදේශීය නියෝජිත
- NAITA ආයතනයේ දිස්ත්‍රික් කළමණාකරුගේ නියෝජිතයෙක්
- මෙම පුහුණු කටයුතු සදහා ඍජු ලෙස සම්බන්ධිත අදාල අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සංස්ථා හා මණ්ඩල නියෝජිතයන්ද අවස්ථානුකූලව කමිටු සාමාජිකයින් ලෙස සම්බන්ධවනු ඇත.

### 4.2 කාර්ය භාරය

4.2.1 මෙම පුහුණු වැඩසටහන සාර්ථක කර ගැනිමට සහ පුහුණු අධික්ෂණ කටයුතු සදහා ප්‍රයෝජනවත්වේ යැයි දිස්ත්‍රික් මෙහෙයුම් කමිටු විසින් හදුනා ගන්නා ගනු ලබන, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල සේවයේ නිරත ක්ෂේත්‍ර නිළධාරී හෝ තාක්ෂණික නිළධාරින් අවස්ථානුකූලව මුදාහැරිමට කටයුතු කිරිම.

4.2.2 ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයන් හි සිටින පුහුණු සම්පත්දායකයින් හදුනා ගැනිම.

..4.

4.2.3 පුහුණු කටයුතු සදහා දේශනශාලා සහ යටිතල පහසුකම් හදුන්වාදීම සහ සපයාදීමට කටයුතු කිරිම.

4.2.4 න්‍යායික දැනුමින් පසු මෙම පුහුණු වන්නන් කර්මාන්ත/ ආයතනයන් හි කාර්යස්ථ පුහුණුව(OJT) සදහා යොමු කිරිමේදී ඒ සදහා අවශ්‍ය පහසුකම් ලබා දීම.

4.2.5 පලාත්, දිස්ත්‍රික් කමිටු විසින් හදුනා ගෙන යොමු කරනු ලබන අදාල තීරණ ක්‍රියාත්මක කිරිම

තවද, මෙම වැඩසටහන සාර්ථක කර ගැනීමට යම් වෙනත් සහයෝගයක් අවශ්‍යාවේ නම් එයද උපරිමයෙන් ලබා දීමට කටයුතු කරන ලෙසද දන්වා සිටිමි. මෙම වැඩසටහන යටතේ පුහුණු කිරීම් සිදුකිරීමට දැනට තෝරාගත් රැකියා ක්ෂේත්‍ර සහ පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු ලැයිස්තුවක් මේ සමග අමුණා ඇත.

ජේ.ජේ.රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. ලේකම් - නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය
3. අධ්‍යක්ෂ ජනරාල් - බහුකාර්ය සංවර්ධන කාර්ය සාධක බලකා දෙපාර්තමේන්තුව

**අඩු අදායම්ලාභී පවුල් වල සාමාජික සාමාජිකාවන් 100,000ක් සඳහා වෘත්තීය පුහුණුව ලබාදීමට අදාල පාඨමාලා**

| අනු අංක | රැකියා ක්ෂේත්‍රය | පාඨමාලාව |
|---|---|---|
| 1 | කෘෂි නිෂ්පාදන සහායක | පැල තවාන් සංවර්ධන |
| | | ක්ෂේත්‍ර සහායක (කෘෂිකාර්මික) |
| 2 | සත්ත්ව පාලනය හා ධීවර කටයුතු සහායක | සත්ව පාලන සහායක |
| | | කිරි ඒකතු කිරීමේ මධ්‍යස්ථාන සහායක |
| 3 | රූපලාවන්‍ය මධ්‍යස්ථාන සහායක | රූපලාවන්‍ය ශිල්පී |
| | | කොණ්ඩ මෝස්තර සැකසුම්කරු |
| 4 | වඩු කාර්මික සහ වඩු සහායක | වඩු කාර්මික (ගෘහ භාණ්ඩ) |
| | | වඩු කාර්මික (ගොඩනැගිලි) |
| 5 | අරක්කැමි, භෝජනාගාර සේවක හා බොජුන්හල් සහායක | භෝජනාගාර සේවක |
| 6 | ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සහායක | ප්‍රජා සෞඛ්‍ය ප්‍රවර්ධන සහායක |
| 7 | පරිගණක, තොරුතුරු තාක්ෂණ, දුරකථන ක්‍රියාකරු සහ සංනිවේදක සහායක | පිළිගැනිමේ නිලධාරි සහායක |
| | | පරිගනක යෙදවුම් සහායක |
| 8 | ආපදා කළමණාකරන සහායක | ග්‍රාමීය ආපදා කළමණාකරන සහායක |
| 9 | රියදුරු හා රියදුරු සහායක | රියදුරු |
| 10 | මත් ද්‍රව්‍ය නිවාරණ කටයුතු සහායක | මත් ද්‍රව්‍ය නිවාරණ කටයුතු සහායක |
| 11 | විදුලි කාර්මික හා විදුලි කාර්මික සේවා සහායක | විදුලි කාර්මික (ගෘහස්ථ) |
| 12 | පරිසර කළමණාකරන සහායක | පරිසර ආරක්ෂක සහායක |
| 13 | ඉන්ධන පිරවුම්හල් හා රථ වාහන පිරිසිදු කිරීමේ සහායක | ඉන්ධන සේවා සහායක |
| | | වාහන සේවාකරු |
| 14 | ගෘහපාලන, සුහසාධන සහ නඩත්තු | ගෘහස්ථ ගෘහ පාලන සහායක |
| 15 | අලෙවි සේවා සහායක | වෙළඳ සැල්සේවා සහායක |
| 16 | පෙදරේරු හා පෙදරේරු සහායක | ඉදිකිරීම් කාර්මික ( පෙදරේරු) |
| | | පින්තාරු කරු (ගොඩනැගිලි) |
| 17 | දැල් හා ධීවර ආම්පන්න අළුත්වැඩියා සහායක | දැල් සහ ධිවර ආම්පන්න අලුත්වැඩියා සහායක |
| 18 | සාත්තු සේවා, පවිත්‍රතා සේවා සහායක | සාත්තු සේවක |
| 19 | පූර්ව ළමාවිය සංවර්ධන සහායක | ළමා සුරකුම් මධ්‍යස්ථාන සහායක |
| 20 | ක්‍රීඩා ආයතන කාය වර්ධන මධ්‍යස්ථාන සහායක , ක්‍රීඩාංගන, පිහිනුම් තටාක සහායක සහ ජීවිතාරක්ෂක සහායක | පිහිනුම් තටාක ජිවිත ආරක්ෂක |
| 21 | තරු පංතියේ සංචාරක හෝටල් , බංගලා සහායක සහ උද්‍යාන අලංකරණ සහායක | බංගලා සහායක |
| 22 | ඇඳුම් මැසීම | ඇඳුම් මසන්නා |
| | | මහන යන්ත්‍ර ක්‍රියාකරු |
| 23 | ප්‍රවාහන කටයුතු සහායක | ප්‍රවාහන කටයුතු සහායක |
| 24 | අවි රහිත ආරක්ෂක නියාමක | ආරක්ෂක නිලධාරි |
| 25 | වෑද්දුම්කරු සහායක සහ ජලනල කාර්මික | ජලනල කාර්මික ශිල්පී |
| | | වෑද්දුම් ශිල්පී |